www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය
2 වන දේශනය

# "තනි රටක සමාජවාදය" සහ 1920 ගනන්වල සෝවියට් ආර්ථික විවාද — 1 වන කොටස

**"Socialism in One Country" and the Soviet economic debates of the 1920s—Part 1**

**නික් බීම්ස් විසිනි**

**2009 මැයි 6**

*ඕස්ට්‍රේලියාවේ සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම්වරයා ද ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජිකයෙකු ද වන නික් බීම්ස් 2007 අගෝස්තුවේ දී ඇමරිකා එක්සත් ජනපදයේ මිචිගන් ප්‍රාන්තයේ ඈන් ආබර් හි පැවැත්වුනු එක්සත් ජනපද සමාජවාදී සමානතා පක්ෂ ගිම්හාන පාසලේ දී දේශන දෙකක් පැවැත්වී ය. මෙම දේශන ආර්ථික ප්‍රතිපත්තිය පිලිබඳව සෝවියට් සංගමය තුල 1920 ගනන්වල දී පැන නැගුනු තීරනාත්මක ගැටුම් සමහරක් හා සම්බන්ධ ය. දේශන පැවැත්වීමෙහි ලා පෙලඹවූ එක් කරුනක් වූයේ 2006 දී ප්‍රකාශයට පත් කල ට්‍රොට්ස්කි නමැති සිය කෘතියෙන් බ්‍රිතාන්‍ය ශාස්ත්‍රඥයෙකු වන ජෙෆ්රි ස්වේන් පෙරට දැමූ විකෘත කිරීම්වලට පිලිතුරු දීමේ අවශ්‍යතාව යි. ඩේවිඩ් නෝර්ත්ගේ ලියොන් ට්‍රොට්ස්කි සහ ඓතිහාසික මුසාකරනය පිලිබඳ පශ්චාත් සෝවියට් ගුරුකුලය යන රචනයෙන් මේ පිලිබඳ තවත් කරුනු දත හැකි ය.*

*පහත පල වන්නේ "තනි රටක සමාජවාදය" පිලිබඳ ස්ටැලින්වාදී න්‍යාය ගැන පැවැත්වූ දෙවන දේශනයේ පලමු වන කොටස යි.*

*ධනවාදය දෙසට ද සමාජවාදය දෙසට ද* නමැති කෘතිය වූකලි සහන කොමිසමෙහි ද අනෙකුත් ආර්ථික ව්‍යාපෘතීන්හි ද නියැලී සිටින අතරතුර ට්‍රොට්ස්කි දැරූ බුද්ධිමය ප්‍රායාසයෙහි මහඟු ඵලවලින් එකකි. සෝවියට් ආර්ථිකයේ වර්ධනය පිලිබඳව ට්‍රොට්ස්කි ඉදිරිපත් කල ඉදිරි දර්ශනය වඩාත් ම සංකේන්ද්‍රිත සහ වඩාත් ම බලපෑම් සහගත ආකාරයෙන් සංක්ෂිප්ත කොට දැක්වෙන විශ්ලේෂනයක් එහි ගැබ් වෙයි. ජෙෆ්රි ස්වේන් එකී විශ්ලේෂනයෙහි අන්තර්ගත වන කේන්ද්‍රීය අදහස් මුලුමනින් ම විකෘත කරයි, මුසාකරනය කරයි.

ස්වේන් කියන පරිදි, "නිවැරදි ආර්ථික ප්‍රතිපත්තිය අනුගමනය කලේ නම් ට්‍රොට්ස්කි කිසි දා 'තනි රටක සමාජවාදය' පිලිබඳ අදහසට විරුද්ධ වන්නේ නැත." ඒ අනුව ගත් විට, ඔහු මෙම කර්තව්‍යයට සම්බන්ධ වීමට "සතුටින්" සිටියේ ය; එමෙන් ම සෝවියට් සංගමය "සමාජවාදය කරා ගමන් කරමින් පවතින" බව ඔහුගේ රචනය [*ධනවාදය දෙසට ද සමාජවාදය දෙසට ද*] "ඉතා පැහැදිලිව" දක්වයි. [1]



**ලියොන් ට්‍රොට්ස්කි**

මෙහි දී ස්වේන් ට්‍රොට්ස්කිගේ ආස්ථානය මුසාකරනය කිරීමේ අරමුනෙන් යුතුව එකිනෙකට වෙනස් කාරනා දෙකක් හිතාමතා ම ව්‍යාකූල කරයි. ඔහුට අනුව, බටහිර රටවල විප්ලවයක් සිදු වන තෙක් කිසිවක් කල නොහැකි යැයි නොනවතින විප්ලව න්‍යාය කියා සිටි බව අවධාරනය කරමින් ස්ටැලින්වාදීන්, ඒ පිලිබඳව කල අපරූපනයට පටහැනිව යමින් ට්‍රොට්ස්කි, සෝවියට් සංගමය තුල සමාජවාදය ගොඩ නැගීමේ පියවරයන් ආරම්භ කිරීමට ඇති

හැකියාව සහ අවශ්‍යතාව හැම විට ම අවධාරනය කලේ ය. ආර්ථික සංවර්ධනය කල හැකි ද කල යුතු ද විය. එහෙත්, තනි රටක් තුල සමාජවාදය ගොඩ නැගීම කෙසේ වෙතත්, එම ක්‍රියා දාමය නිසා ම තවත් ගැටලු සහ අභියෝගයන් නිර්මානය විය.

*1905* නමැති සිය කෘතියට 1922 දී ලියන ලද පෙරවදනෙහි ඡේදයක ට්‍රොට්ස්කි සිය ආස්ථානය විදහා දැක්වී ය. ඔහුගේ විරුද්ධවාදීන් පුන පුනා ගෙන හැර පා ඇති එම ඡේදය මෙසේ යෑ: "අතිමහත් ගොවි ජනතාවක් සහිත පසුගාමී රටක කම්කරුවන්ගේ ආන්ඩුවක් පිහිටුවීමෙහි ලා පවතින ප්‍රතිවිරෝධතාවන් විසඳෙනු ඇත්තේ, ලෝක කම්කරු පන්ති විප්ලවය නමැති සංග්‍රාම භූමියෙහි ජාත්‍යන්තර සන්දර්භයක පමනකි."

*ධනවාදය දෙසට ද සමාජවාදය දෙසට ද* කෘතියෙහි ආරම්භක පිටුවල දී ආර්ථික ක්ෂේත්‍රය තුල මතු වූ ආකාරයෙන් එම ප්‍රතිවිරෝධතාවන්ගෙන් සමහරක් විදහා දැක්වේ. , තවමත් සමාජ ආර්ථිකය තුල නිෂ්පාදකයන් තමන්ගේ ම පෞද්ගලික ආසක්තතාහි නියැලී සිටින ක්‍රියා දාමයක් හමුවේ සමාජවාදය ගොඩ නැගීම, නිෂ්පාදන බලවේගවල වර්ධනය මත රඳා පවතින්නේ යැයි පෙන්වා දෙමින් ට්‍රොට්ස්කි පටන් ගත්තේ ය.

කම්කරුවන් සම්බන්ධයෙන් ගත් විට, එක් විධික්‍රමයක් වූයේ ඔවුන්ගේ වැටුප් ඔවුන්ගේ ශ්‍රමයේ ඵලදායිතාව මත රඳා පවතීම යි. ගොවියා වෙලඳ පොල සඳහා නිෂ්පාදනය කරන තනි පුද්ගලයෙකු ලෙස ක්‍රියා කරන නිසා ඔහුගේ පෞද්ගලික ආසක්තතා මතු වී ආවේ ය. මෙහි දී කම්කරුවා සම්බන්ධයෙන් තීරනාත්මක වෙනසක් පැන නැගින. විෂම වැටුප් ක්‍රමය පන්ති විභේදනයක් හට ගැනීමට හේතු නො වී ය — එක් කම්කරුවෙකුට අනෙක් කම්කරුවෙකුට වඩා වැඩි වැටුපක් ගෙවනු ලබන්නේ වුව ද ඔහු තව මත් කම්කරුවෙක් වූ බැවිනි. එහෙත් ගොවි ජනතාව ධන සම්පත්වලින් ආඪ්‍ය වෙද්දී පන්ති විභේදනයක් හට ගැනේ. තනි ගොවියෙකු වැඩි ධනයක් අත් කර ගනිත් ම ඔහු අනෙකුන් වැඩෙහි යොදන්නට පටන් ගනියි, තවත් ඉඩම් සිය පාලනය යටතට ගනියි, නය සහ වෙනත් උපායන් මාර්ගයෙන් අනෙකුන් සිය පාලනයට නතු කර ගැනීම අරඹයි.

එනම් පන්ති විභේදනයක් සිදු වන්නට පටන් ගනියි. ගොවි ආර්ථිකය වර්ධනය නො වේ නම් සැබවින් ම එවැනි විභේදනයක් හට නො ගනියි. එහෙත් කර්මාන්තවල ව්‍යාප්තියට සහ වර්ධනයට ගොවි නිෂ්පාදනයේ වර්ධනය — සියල්ලට මත් වඩා නගරවලට ධාන්‍ය සැපයීම වර්ධනය වීම — අත්‍යවශ්‍ය ය; සමාජවාදී ආර්ථිකයේ වර්ධනය රඳා පවතින්නේ ඒ මත ය. මේ අනුව නව ආර්ථික ප්‍රතිපත්තිය යනු ඉහලින් ම ප්‍රතිවිරෝධී ක්‍රියා දාමයක් විය. නව ආර්ථික ප්‍රතිපත්තිය තුල ධනවාදී සහ සමාජවාදී ප්‍රවනතාවන් අතර අරගලයක් තිබින. එය මෙම ප්‍රවනතාවන් අතර තරගයක් ද සහයෝගිතාවක් ද යන දෙකෙන් ම සමන්විත වූවක් විය. ගම තුල සිදු වෙමින් පැවති නො වැලැක්විය හැකි පන්ති විභේදන ක්‍රියා දාමයට මුහුන දිය හැකි එක ම මග වූයේ කර්මාන්ත වර්ධනය කිරීම යි. මන්ද, එයින් තනි පුද්ගල ගොවි නිෂ්පාදනය අභිභවා යා හැකි වඩා උසස් නිෂ්පාදන රූපාකාරයකට — එනම්, දියුනු කාර්මික යන්ත්‍රසූත්‍ර යොදා ගන්නා සාමූහික කෘෂිකර්මයට — පදනම සැපයෙනු ඇති බැවිනි.



**සිනොවියෙව්**

සිනොවියෙව් නායකත්වයෙහි සිටි දක්ෂිනාංශය අවධාරනය කලේ සමුපකාරවල වර්ධනය හරහා ගොවීන්ට සමාජවාදය කරා වර්ධනය විය හැකි බව යි. සමුපකාරවල වැදගත්කම ප්‍රතික්ෂේප නොකල ට්‍රොට්ස්කි සංවිධානීය රූපාකාරයක් හැටියට ගත් විට එය ප්‍රමානවත් නොවන බව අවධාරනය කලේ ය. කෘෂිකර්මය සමාජවාදී ආකාරයකට යලි ගොඩ නැගීම පෙරට ගෙන යනු පිනිස එය කාර්මීකරනය කිරීම අවශ්‍ය විය.

*ධනවාදය දෙසට ද සමාජවාදය දෙසට ද* යන කෘතිය ලිවීමට මග පෑදුනේ 1925-26 වසරවල ආර්ථික හැසිරවීම පිලිබඳ ගොස්ප්ලෑනයේ සංඛ්‍යා ලේඛන ප්‍රකාශයට පත් වීමෙනි. ට්‍රොට්ස්කිට කාර්ය භාරයන් දෙකක් පැවරී තිබින: එකක් නම්, බොල්ශේවිකයන් ආර්ථිකය විනාශ කර ඇති බවටත් ධනවාදය යලි පැමිනෙමින් තිබෙන බවටත් විප්ලවයේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී සහ මෙන්ශේවික විරුද්ධවාදීන් කල ප්‍රකාශ ඛන්ඩනය කිරීම යි; දෙවැන්න නම්, කාර්මික

ධාරිතාව, 1913 පැවති මට්ටමට පුනස්ථාපනය කිරීමත් හුදු පුනස්ථාපනයකින් පමනක් නො ව නව යලි ගොඩ නැගීමකින් ද සමන්විත වූ නව යුගයකට පා තැබීමත් සමග සෝවියට් ආර්ථිකය මුහුන දුන් නව ගැටලු කෙරෙහි අවධානය යොමු කිරීම යි.

රාජ්‍යයේ ආර්ථික හැසිරවීම පිලිබඳ ගොස්ප්ලෑනයේ සංඛ්‍යා ලේඛනවල ඓතිහාසික අර්ථභාරයක් ඇතැයි ට්‍රොට්ස්කි පෙන්වා දුන්නේ යඃ එම සංඛ්‍යා වනාහි "තව මත් අසම්පූර්න වුවත්, ධනේශ්වර සමාජය සමාජවාදී සමාජයකට පරිවර්තනය කිරීමේ මහා අත්හදා බැලීමේ පලමු පරිච්ඡේදයේ ප්‍රථම ශේෂ පත්‍රය විය. එමෙන් ම, එම ශේෂ පත්‍රය සමාජවාදයට මුලුමනින් ම වාසිදායක ද වේ." [3]

කිසි ම රටක් සෝවියට් සංගමය තරමට යුද්ධ මාලාවකින් විනාශයට පත්ව සහ හෙම්බත්ව නොතිබිනැයි ඔහු තව දුරටත් කියා සිටියේ ය. එහෙත් වඩාත් ම පසුගාමී වූ ද වඩාත් ම හෙම්බත් වූ ද සෝවියට් සංගමය, විදේශීය සහායෙන් ප්‍රකෘතිමත් වූ ධනවාදී රටවලට පටහැනි අයුරින්, මුලු මහත් ධනවාදී ලෝකයේ ම ක්‍රියාකාරී ප්‍රතිරෝධයට මුහුන දෙමින් මුලුමනින් ම තමන්ගේ ම වූ ප්‍රයත්නයන්ගෙන් ප්‍රකෘතිමත් විය. මෙම විශිෂ්ඨ සංවර්ධනයට හේතුව කුමක් වී ද?

"වැඩවසම්වාදී ඉඩම් හිමිකම සහ ධනේශ්වර දේපල පරිපූර්න වශයෙන් ම අහෝසි කිරීම නිසා ම හා සියලු ප්‍රධාන නිෂ්පාදන මාධ්‍ය ජනසතු කිරීම, රාජ්‍ය සමාජවාදී විධික්‍රම, අවශ්‍ය සම්පත් බලමුලු ගැන්වීම සහ බෙදා හැරීම නිසා ම, ද පමනක් දූවිලි අතරින් යලි නැගී සිටීමට සමත් වූ සෝවියට් සංගමය, දැන් වර්ධනය වන වැදගත්කමක් ඇති සාධකයක් ලෙස සලකා ලෝක ආර්ථික පද්ධතිය තුලට යන සිය ගමන ප්‍රබල කරමින් සිටී." [4]

එහෙත් ට්‍රොට්ස්කි සිය කර්තව්‍යය ලෙස සැලකුවේ, හුදෙක් සෝවියට් ආර්ථිකය ලද ජයග්‍රහන සටහන් කිරීම පමනක් නො වේ. සෝවියට් ආර්ථිකය අත් කර ගත් ජයග්‍රහන නිසා ම මතු වී එන නව ගැටලු සහ අන්තරායන් හඳුනා ගනිමින් සහ ඒවා පරාජය කිරීම ආරම්භ කිරීම සඳහා යොදා ගත හැකි මාධ්‍ය පෙන්වා දෙමින්, ඉදිරි ගමන් මග සටහන් කිරීම ද ඔහු තම කර්තව්‍යයක් හැටියට සැලකී ය.

සෝවියට් සංගමය තුල රාජ්‍ය සහ පෞද්ගලික කර්මාන්ත අතර පැවතිය යුතු සබඳතාව පිලිබඳ ප්‍රශ්නය කොතරම් වැදගත් වුවත් තීරනාත්මක ප්‍රශ්නය වන්නේ එය නොවන බවත් සමස්ත ලෝක ආර්ථිකයට සෝවියට් ආර්ථිකයේ ඇති සම්බන්ධය පිලිබඳ ප්‍රශ්නය "ඊට වඩා වැදගත්" වන බවත් ඔහු අවධාරනය කලේ ය. මන්ද, සෝවියට් ආර්ථිකය ලෝක ආර්ථිකයට පිවිසෙත් ම එහි අනාගත අපේක්ෂාවන් පමනක් නො ව එය මුහුන දෙන අන්තරායන් ද වර්ධනය වූ බැවිනි.

මෙය මෙසේ වූයේ, ධනවාදී රාජ්‍යවල මූලික ශ්‍රේෂ්ඨ භාවය පැවතුනේ භාන්ඩවල මිල අඩුකමෙහි හෙයිනි " එම රාජ්‍ය සතුව වඩා ඉහල ශ්‍රම ඵලදායිතාවක් පැවතියේ ය යන කරුන වෙලඳ පොල තුල ප්‍රකාශයට පත් වූයේ එම රූපාකාරයෙනි; ජයග්‍රහනය කරන්නේ ධනවාදය ද සමාජවාදය ද යන්න අවසන් විග්‍රහයේ දී තීරනය විය හැකි වූයේ ශ්‍රමයේ ඵලදායිතාව අනුව ය.

"සෝවියට් ආර්ථික ක්‍රියාකාරිත්වයේ ගතික සමතුලිතතාව සංවෘත සහ ස්වයංපෝෂිත ඒකකයක ඇති වන සමතුලිතතාව ලෙස කිසි සේත් නො සැලකිය යුතු යැ"යි ට්‍රොට්ස්කි ලිවී ය. "ඒ වෙනුවට, කාලය ගත වී යද්දී අපගේ අභ්‍යන්තර ආර්ථික සමතුලිතතාව වඩ වඩාත් නඩත්තු කෙරෙනු ඇත්තේ ආනයන සහ අපනයන ක්ෂේත්‍රවල දී අප සාක්ෂාත් කර ගන්නා දේවලිනි. උකහා ගෙන ඇති සියලු අනුමානයන් ද සලකා බලමින් මෙම කරුන එහි තර්කානුකූල අන්තය දක්වා ම ලුහුබැඳ යාම සුදුසු ය. ජාත්‍යන්තර ශ්‍රම විභජන පද්ධතිය තුලට අප වඩ වඩා ඇදී යන විට, අපගේ භාන්ඩවල මිල සහ ගුනය වැනි අපගේ දේශීය ආර්ථිකයේ මූලිකාංග, ලෝක වෙලඳ පොල තුල පවතින ඒ හා අනුරූප වන මූලිකාංග මත වඩා විවෘතව ද සෘජුව ද රඳා පවතින තත්ත්වයක් ඇති වේ." [5]

සෝවියට් ආර්ථිකයේ ප්‍රගතිය මැනීමට නව මිනුම් දන්ඩක් සොයා ගැනීමට සිදුව තිබින. ඒ වන විට එකී මිනුම් දන්ඩ බවට පත්ව තිබුනේ, කර්මාන්ත, කෘෂිකර්මය, ප්‍රවාහනය සහ ආර්ථිකයේ අනෙකුත් අංශ, 1913 දී " එනම් යුද්ධය ඇරඹෙන්නට පෙර අවසන් අවුරුද්දේ " අත්පත් කර ගත් මට්ටම් කරා කොතෙක් දුරට ආපසු පැමින තිබේ ද යන්න යි. දැන් එම මට්ටම් ලගා කර ගෙන හෝ ඒවා කරා ලගා වීමට ආසන්නව පැවතින. එබැවින් නව නිර්නායකයක අවශ්‍යතාව මතු විය; එනම් මිල සහ ප්‍රමානය සසඳමින් ලෝක වෙලඳ පොල හමුවේ සෝවියට් කර්මාන්තවල ප්‍රගතිය මිනිය හැකි නව සංගුනක අවශ්‍ය විය. මේ ආකාරයෙන්, ආර්ථිකයේ දුර්වල තැන් හඳුනා ගැනීමටත් ආනයන සහ අපනයන සම්බන්ධයෙන් තාර්කික සැලැස්මක් නිර්නය කර ගැනීමටත් හැකි වනු ඇත. එවැනි සංඛ්‍යා එලිදරව් කර ගැනීම තුල ආයෝජනය සම්බන්ධ පැහැදිලි ඇඟවුම් ද ගැබ්ව තිබින. ඇතැම් යන්ත්‍ර සහ උපකරන වර්ග ආනයනය කිරීමේ හෝ ඒවා දේශීය වශයෙන් නිපදවීමට උත්සාහ දැරීමේ සාපේක්ෂ වාසි සහ අවාසි නිර්නය කර ගැනීමට ඒවායින් හැකි වේ. සෝවියට් සංගුනකයන් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට වඩාත් සමීප වන තැන්වල දී නො ව, පැහැදිලිව ම ඒවා ලෝක ප්‍රමිතීන්ගෙන් දුරස්ත වන ක්ෂේත්‍රවල දී ආනයනය

වඩා වාසිදායක වනු ඇත.

සෝවියට් ආර්ථිකය සිය පූර්ව යුද්ධ නිෂ්පාදන මට්ටම් වෙත ලඟා වීම හෝ එලඹීමත් සමග, ජාත්‍යන්තර වෙලඳ පොල කෙරෙහි පැවති සම්බන්ධය ද වෙනසකට ලක් විය. "තේ රාත්තලකට සහ උකු කිරි ටින් එකකට" හුවමාරුවක් වශයෙන් ජනසතු කල දේපල තුලට සැලකිය යුතු කඩා වැදීමක් කිරීමට අධිරාජ්‍යවාදීන්ට නොහැකි වනු පිනිස, සෝවියට් රුසියාව තමන්ගේ ම හැකියාවන් කෙරෙහි බලාපොරොත්තු තැබීමේ අවශ්‍යතාව ගැන යුද කොමියුනිස්ට්වාදී කාල පරිච්ඡේදයේ දී ට්‍රොට්ස්කි අවධාරනය කල බව අපි යලි සිහිපත් කර ගනිමු. එනමුත් සෝවියට් ආර්ථිකය ප්‍රකෘතිමත් වීමෙන් අදහස් වූයේ නව අවස්ථාවන් මෙන් ම නව අන්තරායන් ද විවෘත වෙමින් පවතින බව යි.

පෙර දී ලෝක වෙලඳ පොල සැලකිල්ලට ගැනුනේ ඒ තුල සැඟව පැවති ආර්ථික අන්තරායන් පිලිබඳ ආස්ථානයෙනි. විදේශ වෙලඳ ඒකාධිකාරය තුල මූර්තිමත් වූ "සමාජවාදී ආරක්ෂනවාදී" පියවරයන් මාර්ගයෙන් සටන් වැදීමට සිදුව තිබූ මෙම අන්තරායන් හඳුනා ගැනීමේ අවශ්‍යතාව ගැන ට්‍රොට්ස්කිට වැඩියෙන් අවධාරනය කල කෙනෙකු නැත. එහෙත් ධනේශ්වර ලෝක වෙලඳ පොල දැවැන්ත අන්තරායන් අඩංගු කර ගත්තා පමනක් නො වේ, එය සෝවියට් ආර්ථිකය සඳහා නව අවස්ථාවන් ද විවෘත කලේ ය.

"තාක්ෂනික ජයග්‍රහන වෙත, එහි වඩාත් ම සංකීර්න ජයග්‍රහන වෙත වඩ වඩාත් ප්‍රවේශ වීමට එය අපට ශක්තිය ගෙන දෙයි. ලෝක වෙලඳ පොල සිය අනෙක් ඒකකයකට සමාජවාදී ආර්ථික ක්‍රමයක් එකතු කරද්දී එය එම සමාජවාදී ක්‍රමය සම්බන්ධයෙන් ඇතැම් අන්තරායන් පැන නංවන මුත්, රාජ්‍යය සිය ආර්ථික ගනුදෙනු විධිමත් ලෙස හසුරුවන්නේ නම් එවිට, සමාජවාදී රාජ්‍යයට මෙම අන්තරායන්ගෙන් ගැලවී ගත හැකි බලගතු ප්‍රතිවිෂකාරකයන් ද ලබා දෙන අතර, අප නිසි පරිදි ලෝක වෙලඳ පොල අපගේ අරමුනු සඳහා යොදා ගන්නේ නම් සමාජවාදයට වාසිදායක වන ආකාරයට තුලනාත්මක සංගුනකයන් වෙනස් කිරීමේ ක්‍රියා දාමය සැලකිය යුතු ලෙස වේගවත් කිරීමට අපට හැකි වනු ඇත." [6]

යන්තම් මාස හතරකට පසු 1925 දෙසැම්බරයෙහි පැවැත්වුනු කොමියුනිස්ට් පක්ෂයේ 14 වන සම්මේලනයේ දී ස්ටැලින් කල ප්‍රකාශ, මෙම විශ්ලේෂනයට පටහැනි විය. ස්ටැලින්ට අනුව, "යන්ත්‍ර සහ උපකරන ආනයනය කරන රටක සිට යන්ත්‍ර සහ උපකරන නිපදවන රටක් බවට එක්සත් සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය පරිවර්තනය වන අයුරින් අපගේ ආර්ථික සංවර්ධනය මෙහෙයවිය" යුතු විය. "... මේ අන්දමින් කටයුතු කිරීමෙන් එක්සත් සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය ... සමාජවාදය ගොඩ



**ස්ටැලින්**

නගන ස්වයංපෝෂිත ආර්ථික ඒකකයක් බවට පත් වනු ඇත." [7]

මෙම ජාතිකවාදී දෘෂ්ටියට විරුද්ධව ට්‍රොට්ස්කි අවධාරනය කලේ, යුද්ධයට පෙර ධනවාදී රුසියාවේ ආර්ථිකය සහ ලෝක වෙලඳ පොල අතර පැවති සංකීර්න අන්තර් සම්බන්ධතා පද්ධතිය ගැන සැලකිලිමත් වීම අවශ්‍ය බව යි. කර්මාන්තවල භාන්ඩ වට්ටෝරුවෙන් තුනෙන් දෙකක් ම පාහේ එතෙරින් ආනයනය කර තිබුනු අතර සැබවින් ම මෙම තත්ත්වය අඛන්ඩව නො වෙනස්ව පැවතී තිබින.

මින් අදහස් වූයේ, ඊලඟ කාල පරිච්ඡේදයේ දී, අවශ්‍ය කරන නව යන්ත්‍රවලින් සමහර විට පහෙන් දෙකකට හෝ උපරිම වශයෙන් අඩකට වැඩි කිසිවක් නිෂ්පාදනය කිරීම වාසිදායක නොවනු ඇති බව යැයි ට්‍රොට්ස්කි තව දුරටත් කීවේ ය. අලුත් යන්ත්‍රසූත්‍ර නිපදවීමට හදිසියේ සිදු කරන ඕනෑ ම පිම්මකින් ආර්ථිකයේ නොයෙකුත් අංශ අතර පවතින සබඳතාව කෙරෙහි අහිතකර බලපෑමක් ඇති විය හැකි ය; පොදුවේ ගත් කල ආර්ථික වර්ධන වේගය අඩු විය හැකි ය. විදේශීය යන්ත්‍ර හෝ පොදුවේ අවශ්‍ය කරන විදේශීය භාන්ඩ හෝ ආනයනය කිරීමට වඩා එවැනි ඌන පූරනයක් සෝවියට් ආර්ථිකයට බෙහෙවින් අනතුරුදායක විය හැකි ය. [8]

තනි රටක සමාජවාදය ගොඩ නැගීමට හැකියාවක් පවතී ය යන සංකල්පය සම්බන්ධයෙන්

ට්‍රොට්ස්කි "පරිපූර්න වශයෙන් ම සතුටට පත්ව" සිටියේ ය යන ස්වේන්ගේ තර්කය වෙත දැන් අපි ආපසු හැරෙමු.

ට්‍රොට්ස්කි අවධාරනය කල පරිදි ගොස්ප්ලෑනයේ සංඛ්‍යාවල පැවති වැදගත්කම වූයේ, නිෂ්පාදන බලවේග පොදුවේ අත් කර ගෙන තිබූ දියුනුව පදනම් කර ගනිමින් ආර්ථිකය තුල දී සමාජවාදී ප්‍රවනතාවන් ධනවාදී ප්‍රවනතාවන්ට වඩා වැඩි ප්‍රමුඛතාවක් අත් කර ගෙන සිටි සැටි ඒවායින් පෙන්නුම් කොට තිබීම යි. නමුත් එය හුදෙක් ආරම්භක ලක්ෂ්‍යයක් පමනක් විය.

"අපගේ අරමුන වූයේ සදහට ම ආර්ථික වශයෙන් හුදෙකලා තත්ත්වයක සිටීම නම් (හෝ අපට එය කල හැකි නම්) මෙම ප්‍රශ්නය න්‍යායික වශයෙන් විසඳා ඇතැයි සිතා ගන්නට අපට පිලිවන් විය හැකි ය. එවිට අන්තරාය අපට තර්ජනය කරනු ඇත්තේ දේශපාලන ක්ෂේත්‍රය තුල දී පමනකි; නැත හොත් අපගේ හුදෙකලාව තුලට පිටස්තරින් මිලිටරිමය කා වැදීමක් සිදු වුව හොත් පමනකි. එහෙත් ආර්ථිකමය වශයෙන් කතා කරන්නේ නම් දැන් අපි ලෝක ශ්‍රම විභජනයේ ක්ෂේත්‍රයට පිවිස ඇත්තෙමු, ඒ අනුව ලෝක වෙලඳ පොල පාලනය කරන නීතිවල ක්‍රියාකාරිත්වයට යටත් වී ඇත්තෙමු, වඩ වඩාත් දැවැන්ත අමාරුකම් ඇති කරමින්, ආර්ථිකය තුල සිටින ධනවාදී සහ සමාජවාදී ප්‍රවනතාවන් අතර සහයෝගිතාව සහ අරගලය වඩා දැවැන්ත පරිමානයක් අත් කර ගනියි." [9]

ස්වේන්ගේ මුසාකරනයන් ගැන ඒ ප්‍රමානවත් ය. යමෙකුට කල හැක්කේ, නිල ප්‍රතිපත්තියක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට පෙරත් ට්‍රොට්ස්කි ස්ටැලින්ගේ තනි රටේ සමාජවාදය පිලිබඳ න්‍යායේ මූලික ප්‍රඥප්තීන් ඛන්ඩනය කර තිබුනේ යැයි අයිසැක් ඩොයිෂ්චර් එලඹි නිගමනයට එකඟ වීම පමනකි.

දැන් අපි ට්‍රොට්ස්කිගේ විශ්ලේෂනයෙහි එන ඉතා වැදගත් ප්‍රතිෂ්ඨාවක් වෙත එලඹෙන්නෙමු. එය වූකලි ස්ටැලින්වාදයට සහ තනි රටක සමාජවාදය පිලිබඳ මතවාදයට එරෙහි ඓතිහාසික අරගලය සම්බන්ධයෙන් පමනක් නො ව ජාත්‍යන්තර සමාජවාදය සඳහා අප අද දින නිරතව සිටින අරගලය සම්බන්ධයෙන් ද බැරෑරුම් ඇඟවුම් අන්තර්ගත කර ගත්තකි.

එය නම් ජාත්‍යන්තර ශ්‍රම විභජනයේ වෛෂයික අර්ථභාරය පිලිබඳ ට්‍රොට්ස්කිගේ සංකල්පය යි. මෙහි දී ආර්ථික ක්ෂේත්‍රය තුල මතු වූ තර්කයන් සංස්කෘතිය පිලිබඳ සිය විශ්ලේෂනයේ දී සහ කම්කරු පන්තික සංස්කෘතිය පිලිබඳ න්‍යායට තමන් පෑ විරුද්ධත්වයේ දී ට්‍රොට්ස්කි වර්ධනය කල මූලික සංකල්ප මත ම පදනම් කරනු ලැබේ.

1927 දී ප්‍රකාශයට පත් කල සංස්කෘතිය සහ සමාජවාදය නමැති ලිපියේ දී, ඓතිහාසික සමාජය වර්ධනය වී ඇත්තේ මිනිසා විසින් මිනිසා සූරා කෑම සඳහා වූ සංවිධානයක් ලෙස බව පැහැදිලි කරමින් ට්‍රොට්ස්කි පටන් ගත්තේ ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් සංස්කෘතිය සමාජයේ පන්ති සංවිධානයට සේවය කර ඇත, එමෙන් ම සූරා කන්නන්ගේ සමාජය සූරා කන්නන්ගේ සංස්කෘතියක් බිහි කර ඇත. මින් අදහස් වන්නේ අප සියලු අතීත සංස්කෘතියට ම විරුද්ධ බව ද?

"සැබවින් ම මෙහි ගැඹුරු පරස්පර විරෝධයක් පවතී. මිනිසාගේ ප්‍රයත්නයන්ගෙන් දිනා ගන්නා ලද, නිර්මානය කරන ලද, ගොඩ නගන ලද, එමෙන් ම මිනිසාගේ ශක්තිය වර්ධනය කිරීම සඳහා හේතු වන සියල්ල ම සංස්කෘතිය වේ. එහෙත් මෙය තනි මිනිසා සම්බන්ධ දෙයක් නො ව සාමාජික මිනිසා සම්බන්ධ දෙයක් වන හෙයින් ද, සැබෑ සාරය අතින් බලන කල සංස්කෘතිය යනු සාමාජික ඓතිහාසික ප්‍රපංචයක් වන හෙයින් ද ඓතිහාසික සමාජය පන්ති සමාජයක් ලෙස පැවත ඇති හෙයින් සහ තව දුරටත් එසේ ම පවතින හෙයින් ද සංස්කෘතිය වූකලි පන්ති පීඩනයේ මූලික අවිය බව පෙනී යයි. මාක්ස් මෙසේ කී යඃ 'යුගයක රජයන අදහස් වනාහි අවශ්‍යයෙන් ම එම යුගයේ පාලක පන්තියේ අදහස් වේ.' මේ කීම සමස්ත සංස්කෘතියට ද අදාල වේ. තතු එසේ වන නමුදු අපි කම්කරු පන්තියට මෙසේ කියමුඃ සමස්ත අතීත සංස්කෘතියෙහි ම කෙල පත් වන්න. එසේ නො කල හොත් ඔබට සමාජවාදය ගොඩ නගන්ට බැරි වන්නේ ය. මෙය තේරුම් ගත යුත්තේ කෙසේ ද?

"බොහෝ පුද්ගලයෝ මෙම පරස්පර විරෝධයෙහි පැකිල වැටී ඇත්තාහ, නිරතුරුව ම ඔවුහු එසේ පැකිල වැටෙති. පන්ති සමාජය යනු මූලික වශයෙන් නිෂ්පාදන සංවිධානය බව අමතක කරමින් ඔවුන් පන්ති සමාජය තේරුම් ගැනීමට නොගැඹුරු ලෙසත් අර්ධ විඥානවාදී ලෙසත් පිවිසීම එසේ පැකිල වැටීමට හේතුව යි. සෑම පන්ති සමාජයක් ම හැඩ ගස්වා ඇත්තේ ස්වභාව ධර්මය සමග අරගලයේ යෙදෙන නිශ්චිත ආකාරයන් පදනම් කොට ගෙන ය. තව ද මෙම ආකාරයන් තාක්ෂනයේ වර්ධනයට අනුකූලව වෙනස් වෙමින් ඇවිත් ඇත. පදනම්වලත් පදනම නම් කුමක් ද? සමාජයේ පන්ති සංවිධානය ද? එසේ නැත හොත් එහි නිෂ්පාදන බලවේග ද? පදනම් වලත් පදනම නම් නිසැකයෙන් ම නිෂ්පාදන බලවේග යි. එම බලවේගයන්ගේ එක්තරා මට්ටමක දී පන්තීන් හැඩ

ගැසෙන්නේත් යලි හැඩ ගැසෙන්නේත් නිශ්චිතව ම එම නිෂ්පාදන බලවේගයන් මත ය. මානව වර්ගයාගේ සාක්ෂාත් කෙරුනු ආර්ථික කුසලතාවත් පැවැත්ම සහතික කර ගැනීමට ඇති ඓතිහාසික හැකියාවත් නිෂ්පාදන බලවේගයන් තුලින් ප්‍රකාශිත වෙයි. මෙම ගතික පදනම මත පන්තීහු නැග එති. ඒ පන්තීහු ස්වකීය අන්තර් සම්බන්ධතාවන් මගින් සංස්කෘතියේ ස්වරූපය තීන්දු කරති." [10]

ලෝක වෙලඳ පොලේ ක්‍රියාකාරිත්වය හරහා හැසිරවෙන ජාත්‍යන්තර ශ්‍රම විභජනයේ වර්ධනය ද සෝවියට් සංගමය තුල සමාජවාදය ගොඩ නැගීම පිලිබඳ ප්‍රශ්නයට එහි ඇති සම්බන්ධය ද ට්‍රොට්ස්කි සලකා බැලුවේ මෙම පුලුල් ඓතිහාසික රාමුව තුල හිඳිමිනි.

ජාත්‍යන්තර ශ්‍රම විභජනය පෙරට ගෙනැවිත් තිබුනේ ධනවාදී ආර්ථිකයෙන් වන නමුත් එය ශ්‍රමයේ ඵලදායිතාව වැඩි කිරීමට සහ නිෂ්පාදන බලවේග වර්ධනය කිරීමට මග පෑදූ ඓතිහාසික සහ සාමාජීය යන්ත්‍රනයක් ද විය.

වෙනත් වචනවලින් කිව හොත්, සංස්කෘතිය පිලිබඳ ක්ෂේත්‍රය තුල දී පැන නගින ප්‍රශ්නය ම ජාත්‍යන්තර ශ්‍රම විභජනය ගැන සලකා බැලීමේ දී ද පැන නගින බව පැහැදිලි යඃ පදනම්වලත් පදනම වන නිෂ්පාදන බලවේගවල වර්ධනය, මානව වර්ගයාගේ නිෂ්පාදන බලවේගවල වර්ධනයට මග පෑදූ ජාත්‍යන්තර ශ්‍රම විභජනය, පන්ති සංවිධානයට වඩා මූලික සාමාජීය පදාර්ථයක් විය. මින් අදහස් වූයේ සෝවියට් ආර්ථිකය තුල සමාජවාදී පියවරයන් වර්ධනය කිරීම ජාත්‍යන්තර ශ්‍රම විභජනයට අනුකුල වන ආකාරයට පටන් ගත යුතුව තිබුනු බව යි, ඒ අයුරින් සෝවියට් සංගමය තුල ක්‍රියාත්මක කරන ආර්ථික පියවරයන්ගෙන් ජාත්‍යන්තර සමාජවාදී ආර්ථිකය පූර්ව රූපනය වනු ඇති බව යි.

අවසන් විග්‍රහයේ දී ආර්ථික ක්‍රියාවලිය දේශපාලන බාධක ජය ගන්නා බව 1925 අගෝස්තු 1 වන දා ප්‍රකාශයට පත් කල ලිපියක දී ට්‍රොට්ස්කි පැහැදිලි කලේ යඃ "අනෙක් රටවල ධනවාදී ක්‍රමයක් පවතින අතරවාරයේ එක රටක සමාජවාදී ක්‍රමයක් පවතින්නේ ය යන කරුනෙන් ලෝක ශ්‍රම විභජනය සහ ඉන් උපදින හුවමාරුව කඩාකප්පල් නො වේ. ... අප රටෙහි කම්කරුවන් සහ ගොවීන් රාජ්‍ය බලය දරන්නේ ය, ඒකාබද්ධ ව්‍යාපාර සහ වෙලඳ මන්ඩල පාලනය කරන්නේ ය යන කරුනෙන්, ඍදෘෂ්ටිවාදයේ ප්‍රතිඵලයක් වශයෙන් නො ව% ස්වාභාවික පරිසරයෙහි සහ ජාතික ඉතිහාසයෙහි අන්තර්ගත වෙනස්කම්වල ප්‍රතිඵලයක් වශයෙන් ඇති වන ලෝක ශ්‍රම විභජනය කිසි සේත් ම බිඳ වැටෙන්නේ නැත." [11]

මින් අදහස් වූයේ සමාජවාදී විප්ලවය ජාත්‍යන්තරව පැතිරෙන තෙක් සෝවියට් සංගමය ආර්ථික වශයෙන් හුදෙකලා කොට තැබීමේ ස්ටැලින්වාදී ඉදිරි දර්ශනය හරය දක්වා ම සදොස් බව යි. අනාගත යුරෝපා එක්සත් ජනපදය, සැබවින් ම නම් අනාගත ලෝක සමාජවාදී ආර්ථිකය යනු හුදෙක් දේශපාලන ඉදිරි දර්ශනයක් පිලිබඳ ප්‍රශ්නයක් නො වී ය. එසේ නොවන අතර, දේශපාලන ඉදිරි දර්ශනය මත් වෛෂයික ආර්ථික ක්‍රියා දාමයේ ප්‍රකාශනයකි. වෙනස් ලෙසකින් කීවොත්, එය තමන් විසින් ම ජාත්‍යන්තර ශ්‍රම විභජනය තුල නවාතැන් සපයා ගත්තේ ය. නිෂ්පාදන බලවේගවල වර්ධනයක් ඇති කල හැකි තාක් දුරට " මෙය සිදු වන්නේ ජාත්‍යන්තර ශ්‍රම විභජනයේ පදනම මත ය " සමාජවාදය ඓතිහාසිකව යුක්ති සහගත වේ.

මීලග කාල පරිච්ඡේදයේ නොයෙකුත් අවස්ථාවලදී ට්‍රොට්ස්කි මේ ගැන අදහස් ප්‍රකාශ කොට තිබේ. 1927 දී ඔහු මෙසේ ලිවී යඃ "යුරෝපා කම්කරු පන්තිය බලය ගෙන නිෂ්පාදනය පාලනය කරන ඍඅවස්ථාව එලඹුනු% විට, ධනේශ්වර රටවල් සමග පවත්වා ගෙන යන අපනයන සහ ආනයනවල ඇති වන විධිමත් ලෙස හසුරුවන ලද වර්ධනයකින්, අනාගත භාන්ඩ සහ නිෂ්පාදන හුවමාරුවේ මූලිකාංග සැකසී එනු ඇත." ඒ අනුව ගත් විට, "අගාධයකින්" එකිනෙකින් වෙන්ව ගිය අවධිවල දී සමාජවාදය ගොඩ නැගීමක් සිදු නො වී ය.



බුඛාරින්

1928 දී කොමින්ටර්නයේ 6 වන සම්මේලනය සඳහා සකස් කෙරුනු කෙටුම්පත් ක්‍රියා මාර්ගය පිලිබඳව කල විචාරයේ දී ද මෙම අදහස ම වෙනස් ආකාරයකින් ප්‍රකාශ වේ. "තනි රටක සමාජවාදය" පිලිබඳ ස්ටැලින්ගේ සහ බුඛාරින්ගේ ඉදිරි දර්ශනය " "ලමයින්

පෙර නිම කල බිල්ඩින් බ්ලොක් යොදා ගනිමින් නොයෙක් ව්‍යුහයන් ඉදි කරන ආකාරයට" " ලෝක සමාජවාදී ආර්ථිකය ජාතික සමාජවාදී ආර්ථිකයන් මාලාවකින් ගොඩ නැගෙන්නක් යැයි කල්පනා කරයි.

"සැබවින් ම, ලෝක සමාජවාදී ආර්ථිකය කිසි සේත් ම ජාතික සමාජවාදී ආර්ථිකයන්ගේ එකතුවක් නොවන්නේ ය. සිය මූලික රූපාකාරයෙන් එයට හැඩ ගැසී ආ හැක්කේ ධනවාදයේ සමස්ත පූර්වගාමී වර්ධනය කරන කොට ගෙන නිර්මිතව ඇති ලෝක ව්‍යාප්ත ශ්‍රම විභජනය නමැති පොලොව මත පමනකි. සාරභූත ලක්ෂන අනුව ගත් විට, එය සංස්ථාපනය වනු ඇත්තේ සහ ගොඩ නැගෙනු ඇත්තේ තනි තනි රටවල් ගනනාවක 'පරිපූර්න සමාජවාදය' ගොඩ නැගීමෙන් පසුව නො ව, දශක ගනනාවක් තිස්සේ දිග හැරෙන ලෝක කම්කරු පන්ති විප්ලවයේ කැලඹීම් සහ චන්ඩ මාරුත මධ්‍යයේ දී ය. කම්කරු පන්ති ආඥාදායකත්වය පිහිටුවනු ලබන පලමු රටවල ආර්ථික සාර්ථකත්වය මැනෙනු ඇත්තේ ඒවා ස්වයංපෝෂිත 'පරිපූර්න සමාජවාදයක්' වෙත ලගා වී ඇති තරම අනුව නො ව, ආඥාදායකත්වයේ ම (කම්කරු පන්තියේ) දේශපාලනික ස්ථාවර භාවයෙන් සහ අනාගත ලෝක සමාජවාදී ආර්ථිකයේ මූලිකාංගයන් සකස් කිරීමෙහි ලා අත්පත් කර ගන්නා සාර්ථකත්වයන්ගෙනි." [12]

කොමියුනිස්ට් පක්ෂය තුල තනි රටක සමාජවාදය පිලිබඳව ඇති වූ අරගලයේ ආරම්භය වටා වූ තොරතුරුවලින් එකල ට්‍රොට්ස්කිගේ අරමුනු සහ ක්‍රියාවන් කෙබඳු වී දැයි අනුමාන කල හැකි දෑ සැපයී ඇත. තනි රටක සමාජවාදයට එරෙහි සටන තුල, විප්ලවවාදී ඉදිරි දර්ශනයක ඇතුලත් වන සියලු කේන්ද්‍රීය ප්‍රශ්න ගැබ් වූ බව නොනවතින විප්ලවයේ රුසියානු සංස්කරනයට ලියූ පෙරවදනේ දී ඔහු පැහැදිලි කලේ ය. නොනවතින විප්ලවය ද තනි රටක සමාජවාදය ද යන විකල්පය, "සෝවියට් සංගමයේ අභ්‍යන්තර ගැටලු ද නැගෙනහිරෙහි විප්ලවය පිලිබඳ අපේක්ෂාවන් ද අවසානයේ සමස්ත කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ ම ඉරනම ද එක විට වැලඳ ගනී" යැයි ඔහු ලීවේ ය. [13]

ගැටුම පලමුව පැන නැගි 1925 දෙසැම්බරයේ දී පැවැත්වුනු 14 වන පක්ෂ සම්මේලනයේ දී ට්‍රොට්ස්කි නිහඬව සිටි අතරවාරයේ, ගැටුමට මුල පිරුවේ සිනොවියෙව් සහ කමනෙව් බැවින් ට්‍රොට්ස්කිගේ ක්‍රියාවන් පිලිබඳ අනුමානයෝ මතු වී එත්. ට්‍රොට්ස්කි නායකත්ව කාර්ය භාරයකට පත්වීම වැලැක්වීමටත් අවසානයේ දී ඉන් ඉවත් කරනු පිනිස එකට එක් වී ගත් සිනොවියෙව්, කමනෙව් සහ ස්ටැලින් යන තුන් කට්ටුව මේ වන විට ඉදිරි දර්ශනය පිලිබඳ වඩාත් ම මූලික ප්‍රශ්නය මත බිඳී විසිරී යමින් පැවතින. තව මත්



කමනෙව්

ප්‍රාරම්භක සටනට ට්‍රොට්ස්කි ඇද ගැනුනේ නැත.

මෙම සිදුවීම් ගැන අදහස් දක්වමින් ඊ.එච්. කාර් මෙසේ ලියුවේ යː "දාහතර වන පක්ෂ සම්මේලනයේ දී තුන් කට්ටුව තුල ඇති වූ භේදය එක් වෙහෙසකර ප්‍රහේලිකාවක් ඉතිරි කොට ගියේ යː එනම් ට්‍රොට්ස්කිගේ ආස්ථානය යි. තුන් කට්ටුව පිහිටා සිටි ප්‍රධාන පදනම වූයේ ට්‍රොට්ස්කි සම්බන්ධයෙන් ඔවුන් තුල පැවති සතුරුකම යි." කෙසේ වුව ද, සම්මේලනයේ දී වඩා ශක්තිමත් බව පෙනී ගොස් තිබුනේ ට්‍රොට්ස්කිගේ ආස්ථානය යැයි කාර් තව දුරටත් පවසයි. "සම්මේලනයෙහි නියෝජිතයෙකු වූ නමුත්, අලුත් කන්ඩායම් දෙක එකිනෙකා කැලිවලට ඉරා ගන්නා අතරවාරයේ, කතා කිරීමට නැගී නො සිට ඔහු මුලු සභා කාලය පුරා ම සාඩම්බර ලෙස වාඩි වී සිටියේ ය." [14]

තුන් කට්ටුවේ සාමාජිකයන් අතර ගැටුම වසරක් තිස්සේ කැකෑරෙමින් තිබූ බව සඳහන් කරමින් ඩොයිෂ්චර් මෙසේ අදහස් දැක්වී යː "එලඹෙන තෙක් ට්‍රොට්ස්කි පොරොත්තු වෙමින් සිටි යලි පෙල ගැසීම — ක්‍රියාකාරී වීමට අවස්ථාව — මෙය වී යැයි පෙනී යන්නට ඇත. එහෙත් මේ මුලු කාලය පුරා ම, පක්ෂය භේද කල ගැටලු ගැන නො දැන සිටියාක් මෙන් ඔහු ඒවායින් ඈත් වී, ඒවා ගැන නිහඬ වී සිටියේ ය." [15]

කෙසේ වුව ද, ජෙෆ්රි ස්වේන් අත නම් සූදානම්

කර ගත් පිලිතුරක් තිබෙන්නේ යඃ ආර්ථික තීරන ගැනීමේ දී දේශපාලන මන්ඩලය කල "බාධා කිරීම්" නිසා අපේක්ෂා භංගත්වයන් ඇති වුව ද ඒ සියල්ල නො තකා දැන් ප්‍රගතියක් ඇති වෙමින් තිබින. "එහි අවසානයක් දැකීම සඳහා ස්ටැලින් සමග වැඩ කරන්නට ඔහු සූදානමින් සිටියේ ය." [16]

ස්වේන් කියන පරිදි නිවැරදි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නේ නම් පමනක් තනි රටක සමාජවාදය ගොඩ නැගිය හැකි බවට ඔහු ස්ටැලින් සමග එකඟ වූයේ නම්, ඔහු ගැටුමකට එන්නේ ඇයි?

දේශපාලන බලය අත්පත් කර ගැනීම සඳහා වූ අරගලයක ආස්ථානයෙන් සලකා බැලුව හොත්, තුන් කට්ටුව තුල ඇති වූ භේදය නො තකා හරිමින් ට්‍රොට්ස්කි පල කල නිහඬ භාවය සහ සුපැහැදිලි අක්‍රිය භාවය හුදෙක් "අභිරහසක්" පමනක් වෙයි. මෙම ආස්ථානයෙන් ගත් විට, යමෙකු සිය විරුද්ධවාදීන් අතර ඇති වන භේදයක දී ඉන් උපරිම වාසිය ගැනීම සඳහා සැලසුම් කල ක්‍රියා පටිපාටියකට මුල පුරන බව පැහැදිලිව ම පෙනී යනු ඇති බැවිනි. එහෙත්, නිවැරදි ඉදිරිදර්ශනයකින් බලන විට, එනම් ට්‍රොට්ස්කි උත්සුකව සිටි ක්‍රියා මාර්ගය සහ ඉදිරි දර්ශනය පිලිබඳ ගැටලුවල ආස්ථානයෙන් බලන විට, 14 වන සම්මේලනය හාත්පස වූ සිදුවීම්වල අර්ථය පහසුවෙන් ග්‍රහනය කර ගත හැකි ය.

තනි රටක සමාජවාදය පිලිබඳ මතවාදයේ මුල් බීජ අන්තර්ගත වූයේ ට්‍රොට්ස්කිගේ නොනවතින විප්ලව න්‍යායට එරෙහිව යමින් 1924 දෙසැම්බරයේ දී ස්ටැලින් ප්‍රකාශයට පත් කල "ඔක්තෝබර් විප්ලවය සහ රුසියානු කොමියුනිස්ට්වාදීන්ගේ උපායෝ" යන මැයෙන් වූ ලිපියක ය.

ස්ටැලින් මෙසේ ලිවී යඃ "ලෙනින්ට අනුව, විප්ලවය සිය බලවේග උකහා ගන්නේ සියල්ලට මත් වඩා රුසියාවේ ම කම්කරුවන් සහ ගොවීන් අතුරිනි. ට්‍රොට්ස්කිට අනුව අත්‍යවශ්‍ය බලවේග සොයා ගත හැකි වන්නේ 'ලෝක ව්‍යාප්ත කම්කරු පන්ති විප්ලවයක සංග්‍රාම භූමිය තුල' පමනකි. ඒ එසේ නම්, ලෝක විප්ලවය නියත වශයෙන් ම පමා වුව හොත් ඇති විය හැකි තත්ත්වය කුමක් ද? අපගේ විප්ලවය පිලිබඳ බලාපොරොත්තුවේ මන්දාලෝකයක් වත් පවතින්නේ ද? ට්‍රොට්ස්කි සහෝදරයා අපට බලාපොරොත්තුවක සේයාවක් වත් නො පිරිනමයි ... මෙම සැලැස්මට අනුව අපගේ විප්ලවය සන්තකව ඇත්තේ එක ම එක අපේක්ෂාවකිඃ එනම්, ලෝක ව්‍යාප්ත විප්ලවය එලඹෙන තෙක් පොරොත්තු වෙමින්, තමන්ගේ ම ප්‍රතිවිරෝධතාවන් තුල ගිලී යාම සහ සිය මුල් දිරාපත් වන්නට ඉඩ හැරීම යි." [17]

මීට යන්තම් දස මසකට පෙර ලෙනින්වාදයේ පදනම් නමැති සිය කෘතියේ දී ස්ටැලින් ලෙනින්ගේ අදහස් මෙසේ සාරංශගත කර තිබිනඃ "තනි රටක් තුල ධනේශ්වරයේ බලය පෙරලා දැමීමෙන් සහ කම්කරු පන්තික ආන්ඩුවක් ස්ථාපනය කිරීමෙන් සමාජවාදයේ පරිපූර්න ජයග්‍රහනය සහතික වන්නේ නැත. සමාජවාදයේ ප්‍රධාන කර්තව්‍යය වන සමාජවාදී නිෂ්පාදනය සංවිධානය කිරීම පවතින්නේ ඉදිරියෙහි ය. මෙම කර්තව්‍යය මුදුන් පමුනුවා ගත හැකි වේ ද? දියුනු රටවල් කිහිපයක කම්කරුවන්ගේ ඒකාබද්ධ උත්සාහයන්ගෙන් තොරව තනි රටක සමාජවාදයේ අවසන් විජයග්‍රහනය සාක්ෂාත් කල හැකි වේ ද? නැත, එය කල නොහැකි ය. ධනේශ්වරය පෙරලා දැමීම සඳහා තනි රටක උත්සාහයන් ප්‍රමානවත් ය. අපගේ විප්ලවයේ ඉතිහාසය මීට සාක්ෂි දරයි. සමාජවාදයේ අවසන් විජයග්‍රහනය සඳහා, සමාජවාදී නිෂ්පාදනය සංවිධානය කිරීම සඳහා තනි රටක, විශේෂයෙන් ම රුසියාව වැනි ගොවිජන රටක උත්සාහයන් ප්‍රමානවත් වන්නේ නැත. මේ සඳහා දියුනු රටවල් කිහිපයක කම්කරුවන්ගේ උත්සාහය අවශ්‍ය ය. සමස්තයක් ලෙස ගත් විට, කම්කරු පන්තික විප්ලවය පිලිබඳ ලෙනින්වාදී න්‍යායේ ආවේනික ගුනාංග මෙබඳු ය."

එහෙත්, වසර අවසන් වෙද්දී පහත දැක්වෙන තහවුරු කිරීමත් සමග කෘතිය යලි නිකුත් වියඃ

"කම්කරු පන්තියට තනි රටක් තුල සමාජවාදී සමාජයක් ගොඩ නැගිය හැකි ය, ඔවුන් එය ගොඩ නැගිය යුතු ය." ඒ පසුපසින්, "කම්කරු පන්ති විප්ලවය පිලිබඳ ලෙනින්වාදී න්‍යාය" සංස්ථාපනය වන්නේ මෙයිනැයි යන සහතික කිරීම ද විය.

කෙසේ වුව ද, නව ධර්මතාවේ අර්ථභාරය වහා ම දෘශ්‍යමාන නො වී ය. 1925 ජනවාරියේ දී ට්‍රොට්ස්කි අපවාදයට ලක් කරමින් සිනොවියෙව් කෙටුම්පත් කල යෝජනාවෙහි එය පෙනෙන්නට නොතිබූ බව ඊ.එච්. කාර් සටහන් කරයි. ඒ අවස්ථාවේ දී ස්ටැලින් සිය කතාවෙහි ඒ ගැන සඳහන් නොකලේ ය. එමෙන් ම, 1924-25 ශීත ඍතුවෙහි සිදු වූ කෘෂිකාර්මික ප්‍රතිපත්තිය පිලිබඳ විවාදයේ දී ද එය සාකච්ඡාවට ගැනීමට කිසිවෙකු කල්පනා කලේ නැත. "1924 දෙසැම්බරයේ දී පල කල ලිපියෙහි එය මුල් වරට දර්ශනය වීමෙන් පසුව තුන් මසක නිහඬතාවක් පැවතින. එම කාලය තුල දී, එහි කතුවරයා ද ඇතුලුව පක්ෂයේ නායකයන් සහ ප්‍රකාශකයන් තනි රටක සමාජවාදය පිලිබඳ න්‍යාය නොතකා හැර ඇති සෙයක් පෙනෙන්නට තිබින." [18]

ධනවාදයේ ස්ථාවරත්වය පිලිගැනීමේ පිලිබිඹුවක් වශයෙන් තනි රටක සමාජවාදය ගොඩ නැගීමේ හැකියාවට පිලිගැනීමක් අත් විය යුතු යැයි

1925 වසන්තයේ දී තර්ක කරමින් එය ඔසවා තබා වර්ධනය කලේ බුඛාරින් ය. බටහිරෙහි ධනවාදය ස්ථාවරත්වයට පත් වීම "අපගේ අභ්‍යන්තර ආර්ථික තත්ත්වය ගැන අප කල්පනා කරන ආකාරය කෙරෙහි යම් තරමක බලපෑමක් කරන" බව ඔහු තරයේ කියා සිටියේ ය. ඔහු මෙසේ ද කී යː බටහිර යුරෝපය තුල ධනවාදය ප්‍රකෘතිමත් වෙමින් පවතින්නේ යැයි පිලිගන්නේ නම් "සමාජවාදය ගොඩ නැගීම පිලිබඳ අපගේ බලාපොරොත්තුව අවසානය කරා ලඟා වී ඇති බවක් ඉන් නොහැඟවෙන්නේ ද? වෙන විදියකින් කිව හොත්, විජයග්‍රාහී යුරෝපා කම්කරු පන්තියේ ඍජු සහාය නොමැතිව අපට සාර්ථකත්වය ලඟා කර ගත හැකි වේ ද? තනි රටක සමාජවාදය ගොඩ නැගීමේ හැකියාව පිලිබඳ ප්‍රශ්නය බවට ඌනනය වූයේ මෙම ප්‍රශ්නය ය." වඩා බල සම්පන්න ආකාරයකින් ශ්‍රමය යොදා ගනිමින් සම්පත් අත්පත් කර ගත හැකි වූයේ නම් සමාජවාදය ගොඩ නැගිය හැකි විය. [19]

1925 දෙසැම්බරයෙහි 14 වන සම්මේලනය පැවැත්වෙන අවස්ථාව වන විට, විරුද්ධ පාර්ශ්වය තලා දැමීමෙහි ලා යොදා ගත හැකි ආයුධයක් ලෙස නව ධර්මතාවේ දේශපාලනික ප්‍රයෝජනවත් භාවය කිසි දා නොවූ තරම් පැහැදිලිව පෙනෙන තත්ත්වයකට පත් වෙමින් තිබින. සමාජවාදී ජාත්‍යන්තරවාදයේ සහ මාක්ස්වාදයේ ක්‍රියා මාර්ගයට සහ ඉදිරි දර්ශනයට එරෙහි සටනෙහි ලා තමන්ට හිමි තැන තහවුරු කර ගත් තත්වය තුල තනි රටේ සමාජවාදය නැගී එන නිලධාරී තන්ත්‍රයේ ජාතිකවාදී ධර්මතාවය බවට පත් වන්නට නියමිත විය.

දාහතර වන සම්මේලනයේ වේදිකාව මත දී තුන් කට්ටුවේ සාමාජිකයන් අතර ගැටුම පුපුරා ගිය විට ට්‍රොට්ස්කි මවිතයට පත් විය. ඔහු පසුව ඩේවි කොමිසම හමුවේ කියා සිටි පරිදිː "සම්මේලනයේ දී ස්ටැලින් සහ සිනොවියෙව් සහ කමනෙව් අතර අරගලයක් ඇති වීම පිලිබඳ අපේක්ෂාවක සේයාවක් වත් නොතිබින. සමස්ත තත්ත්වය ම වෙනස් වූ බැවින් සම්මේලනය අතරතුර දී මම අවිනිශ්චිතතාවෙන් යුතුව බලා සිටියෙමි. එය මට මුලුමනින් ම දුරවබෝධ බවක් පෙනී ගියේ ය." [20]

අනපේක්ෂිතතාවේ ග්‍රහනයට හසු වූ ඔහු ගැටුමේ ද ප්‍රතිවිරුද්ධ පාර්ශ්වයන් නියෝජනය කල ප්‍රවනතාවන්ගේ ද අර්ථය කුමක් දැයි නිර්නය කර ගැනීමට උත්සාහ කලේ ය. දෙසැම්බර් 14 වන දා, ඔහු තමන් පෙරට යා යුතු විධික්‍රමය කෙටුම්පත් කරමින් සටහනක් කලේ ය.

ඔහු මෙසේ ලිවී යː "කිසි යම් මොහොතක දී තමන් ගැන ම කියන දේවලින් හෝ හඬ නගන සටන් පාඨවලින් හෝ පන්ති වත් පක්ෂ වත් විනිශ්චය කල නොහැකි ය. දේශපාලන පක්ෂයක් තුල සිටින කන්ඩායම් සම්බන්ධයෙන් ද මෙය මුලුමනින් ම අදාල වේ. සටන් පාඨ එකලාව සැලකිල්ලට නො ගත යුතු ය, ඒවා ඒවායේ සමස්ත වටාපිටාව ද විශේෂයෙන් ම යම් නිශ්චිත කන්ඩායමක ඉතිහාසය, එහි සම්ප්‍රදායන්, ඒ තුල මානව සම්පත තේරුම් බේරුම් කර ගන්නා ආකාරය යනාදියට ද සම්බන්ධ කොට සැලකිල්ලට ගත යුතු ය." [21]

සිනොවියෙව්-කමනෙව් කන්ඩායම සම්බන්ධයෙන් ගත් විට, ස්ටැලින්-බුඛාරින් කන්ඩායමට එය පෑ විරුද්ධත්වයෙන් කුමක් ඇඟවුනේ දැයි කිසි සේත් පැහැදිලි නො වී ය. මුල දී, ගොවි ජනතාව

"අවතක්සේරු කිරීම" සම්බන්ධයෙන් ට්‍රොට්ස්කිට චෝදනා නැගුවන් අතර සිනොවියෙව් ප්‍රමුඛයා වී සිටියේ ය. සම්මේලනයට සූදානම් වෙමින් සිටි කාල පරිච්ඡේදයේ දී සිනොවියෙව් ප්‍රධානත්වය දැරූ ලෙනින්ග්‍රෑඩ් සංවිධානය සහ මධ්‍යම කාරක සභාව අතර ඇති වූ ගැටුමේ සාමාජීය මූලයන් නිසැකව ම පිහිටා තිබුනේ කම්කරු පන්තිය සහ ගොවි ජනතාව අතර සබඳතාව පිලිබඳ ප්‍රශ්නය තුල යැයි ට්‍රොට්ස්කි සටහන් කලේ ය.

එහෙත් කිසිදු විශේෂ යෝජනාවක් ඉදිරිපත් වී තිබුනේ වත් මූලික මූලධර්ම පැහැදිලි කරන කිසිදු වැඩ පිලිවෙලක් විස්තාරනය කොට තිබුනේ වත් නැත. තව දුරටත් කිව හොත්, පක්ෂ තන්ත්‍රයේ "මුලුමනින් ම පෙර නොවූ විරූ ක්‍රියා කලාපය" නිසා එකිනෙකට වෙනස් කන්ඩායම් තුල ක්‍රියාත්මක වන පන්ති ප්‍රවනතාවන්ගේ නිශ්චිත ස්වභාවය උකහා ගැනීම සම්බන්ධයෙන් "අත්‍යසාමාන්‍ය දුෂ්කරතාවක්" පැවතින. මෙය ලෙනින්ග්‍රෑඩ් සංවිධානය මුලුමනින්ම පාහේ ඒකඡන්දයෙන් මධ්‍යම කාරක සභාවට එරෙහි යෝජනාවක් ඉදිරිපත් කිරීමට ද ඒ අතරවාරයේ සියලු සාමාජිකයන්ගේ සහභාගිත්වයෙන් මොස්කව් සංවිධානය ලෙනින්ග්‍රෑඩයට එරෙහිව යෝජනාවක් සම්මත කර ගැනීමට ද තුඩු දී තිබින.

ස්ටැලින්ට සහ ඔහුගේ තනි රටක සමාජවාදය පිලිබඳ ධර්මතාවට එරෙහිව මෑත දී ආරම්භ වූ සිනොවියෙව්ගේ විරුද්ධත්වයෙහි මුහුනත වටිනාකම පමනක් භාර ගෙන නිකම් සිටින්නට ට්‍රොට්ස්කිට පුලුවන්කමක් තිබුනේ නැත. සියල්ලටත් වඩා, සිනොවියෙව්ගේ සැබෑ ආස්ථානය කුමක් වී දැයි කිසි සේත් ම පැහැදිලි නො වී ය.

"අපගේ වැනි රටක" දී සමාජවාදයේ "පරිපූර්න විජයග්‍රහනය" සාක්ෂාත් කර ගත හැකි යැයි ලෙනින් විශ්වාස කල නමුත් ජාත්‍යන්තර විප්ලවවාදියෙකු ලෙස

ක්‍රියා කල ලෙනින් "ජාත්‍යන්තර විප්ලවයකින් තොරව අපගේ විජයග්‍රහනය අස්ථාවර සහ අසම්පූර්න වන බව අවධාරනය කිරීම කිසි දා නතර කලේ නැතැ"යි 1925 අප්‍රේල්වල දී ඔහු පක්ෂ සම්මේලනයක් හමුවේ පවසා තිබින. මෙලෙස, සිනොවියෙව්ගේ අවුල් ජාලයට අනුව, තනි රටක් තුල දී "පරිපූර්න" නමුත් "අසම්පූර්න" සහ "අස්ථාවර" සමාජවාදී විජයග්‍රහනයක් ලැබිය හැකි විය.

තවත් අවුලක් වූයේ නව විරුද්ධ පාර්ශ්වයේ සංයුතිය යි. "මූල්‍ය සම්මුතියට" පක්ෂව කතා කලවුන්ගේ නායකයෙකු වූ සොකොල්නිකොව් ලෙනින්ග්‍රෑඩ් විරුද්ධ පාර්ශ්වයේ නායකයන් අතර විය. "තනි රටක සමාජවාදය" කෙරෙහි ඔහුට ඇති විරුද්ධත්වය මතු වී එනු ඇත්තේ වමෙන් නො ව දකුනෙනි. කලින් ඔහු ආන්ඩුවේ මුදල් වඩා දැඩි පාලනයකට යටත් කිරීමේ නාමයෙන් — "සමාජවාදී ආරක්ෂනවාදය" යැයි ට්‍රොට්ස්කි ගුනාංගීකරනය කල — විදේශ වෙලඳාමේ ඒකාධිකාරය දුර්වල කිරීමට පක්ෂව කතා කරන්නෙකුව සිටියේ ය. "ඔහු ගම්බදට සම්බන්ධව ගත් කල කම්කරු පන්තිය ආර්ථික වශයෙන් නිරායුධ කිරීමේ න්‍යායවාදියා විය, තව මත් එහි න්‍යායවාදියාව සිටී" යැයි ට්‍රොට්ස්කි ලීවේ ය. පැහැදිලි,ව කල්පනාකාරීව සකස් කරන ලද කිසිදු ඉදිරි දර්ශනයක් සිනොවියෙව්ගෙන් ඉදිරිපත් නොවූ තත්ත්වය තුල සොකොල්නිකොව්ගේ ක්‍රියා මාර්ගය නව විරුද්ධ පාර්ශ්වයේ ප්‍රතිපත්තිය බවට පත් වන්නට ඇත.

"කමනෙව්, සිනොවියෙව් සහ අනෙකුත් අය කර්මාන්තය රාජ්‍ය ධනවාදයේ සංරචක අංගයක් ලෙස තව මත් සලකති" යි යන කරුනෙන් මෙම අන්තරාය අවධාරනය විය. 1921 දී නව ආර්ථික ප්‍රතිපත්තිය පටන් ගැනීමේ දී ලෙනින් සමස්ත ආර්ථික තන්ත්‍රය රාජ්‍ය ධනවාදය හැටියට ගුනාංගීකරනය කර තිබිනැයි ට්‍රොට්ස්කි සටහන් කලේ ය. නමුත් මෙය සිදු වූයේ කර්මාන්ත අඩපනව තිබූ සමයක වූ අතර, මිශ්‍ර සමාගම්වල ස්වරූපයෙන් ආර්ථික සංවර්ධනය පෙරට යනු ඇතැයි ද ඒවායින් සමහරක් විදේශ ආයෝජන ඇද ගනිතැයි ද අපේක්ෂා කෙරින. සැබවින් ම මෙය සිදු නො වී ය. සංවර්ධනය වඩා වාසිදායක මාවත් ඔස්සේ සිදු වී ගෙන ගියේ ය, රාජ්‍ය කර්මාන්ත තීරනාත්මක තත්ත්වයක් අත් කර ගත්තේ ය; ඒ අතර වාරයේ මිශ්‍ර සමාගම් ද අලෙවි වැයික්කි වෙන් කර ගත් ව්‍යාපාර ද කල් බදු ව්‍යවසායන් ද හිමි කර ගත්තේ නොවැදගත් වෙලඳ පොල පංගුවකි. කෙසේ වුව ද, නව විරුද්ධ පාර්ශ්වයේ නායකයෝ රාජ්‍ය ධනවාදය යන භාෂිතය නොකඩවා ම යොදා ගත්හ.

ට්‍රොට්ස්කි මෙසේ ලීවී යː "වසර තුන හතරකට එපිට දී පොදුවේ මෙම මතවාදය වැලඳ ගෙන සිටි ඔවුහු, 1923-24 සාකච්ඡාව අතරතුර දී විශේෂයෙන් ම නොනවත්වන ආකාරයකින් එය එලියට ගත්හ. මෙම මතවාදයේ සාරය වන්නේ, කර්මාන්ත යනු ගොවි ආර්ථිකය, මූල්‍යය, සමුපකාර, රාජ්‍යයෙන් හැසිරවෙන පෞද්ගලික අයිතිය සහිත ව්‍යවසායන් යනාදියෙන් සමන්විත වන පද්ධතියක් තුල, පවතින අප්‍රධාන කොටසක් ය යන්න යි. රාජ්‍ය ධනවාදී ක්‍රමය සංස්ථාපනය වන්නේ රාජ්‍යයෙන් හැසිරවෙන සහ පාලනය වන මෙම සියලු ආර්ථික ක්‍රියා දාමයන් එක් වීමෙනි. එය අවධීන් මාලාවක් තුලින් සමාජවාදය කරා යොමු වනු ඇතැයි කියනු ලැබින. මෙම පටිපාටිය තුල දී, කර්මාන්ත ඉටු කරන ප්‍රමුඛ කාර්ය භාරය මුලුමනින් ම අතුරුදන්ව ගියේ ය. නඩු හබයක පැටලී සිටින දෙපාර්ශ්වයක් මෙන් සලකමින්, ගොවි ආර්ථිකය සහ රාජ්‍ය කර්මාන්ත අතර අතර මැදියෙකුගේ කාර්ය භාරය භාර ගත් [සොකොල්නිකොව්ගේ] නය-මූල්‍ය හැසිරවීම පිලිබඳ ක්‍රියා මාර්ගය සැලසුම්කරන මූලධර්මය මුලුමනින් ම පාහේ පසෙකට තල්ලු කර දැමී ය." [22]

ප්‍රශ්නයේ සාරය ගැබ්ව පවතින්නේ කර්මාන්ත සංවර්ධනය කිරීම තුල ය. ගම්බද ප්‍රදේශවල දී මූලික වෙනස්කම් ඇති කල හැකි වන්නේ එම ක්‍රමයෙන් පමනකි. නය සහ මූල්‍ය හැසිරවීම තුල කිසිදු සැලසුම්කරන මූලධර්මයක් ඇතුලත් නො වී ය; ඒවා තුල සමාජවාදය කරා පෙරට යාමක් පිලිබඳ කිසිදු සහතිකයක් ගැබ්ව නොතිබින.

සැලසුම්කරනයේ සහ කාර්මීකරනයේ අර්ථභාරය සම්බන්ධ තවත් පැතිකඩක් ද පැවතින — එනම් පක්ෂය තුල තන්ත්‍රය යි. එහෙත් කේන්ද්‍රීය ප්‍රශ්නය වන්නේ ස්ටැලින් නමැති පුද්ගලයා යැයි සිනොවියෙව් මෙන් ට්‍රොට්ස්කි සැලකුවේ නැත. පක්ෂ යන්ත්‍රනය මත පදනම් වූ ස්ටැලින් සහ ඔහු නායකත්වය දුන් නිලධාරිවාදී පාලනය, අවසන් විග්‍රහයේ දී සෝවියට් සංගමයේ ආර්ථික සහ සංස්කෘතික පසුගාමිත්වයේ ද කම්කරු පන්තියේ දිලිඳු භාවයේ ද ප්‍රකාශනයක් විය. එම නිසා නිලධාරිවාදය පරාජය කල හැකි වන්නේ සැලසුම්කරනය සහ කාර්මීකරනය ප්‍රධාන සංරචක වන ආර්ථික සහ සංස්කෘතික සංවර්ධනය පිලිබඳ ක්‍රියා මාර්ගයක් තුලින් පමනකි.

ලෙනින්ග්‍රෑඩ් නායකත්වයේ ඉදිරි දර්ශන සහ ඔවුන් නායකත්වය දුන් තන්ත්‍රයේ ස්වභාවය සම්බන්ධයෙන් ට්‍රොට්ස්කි තුල උත්සුකතාවන් පැවතුන ද ඔහු මෙම නිගමනයට එලඹියේ යː එනම්, මෙම විරුද්ධ පාර්ශ්වය පැන නැගීමෙන් විකෘත ආකාරයකට නියෝජනය වූයේ ගොවි ජනතාවට නොකඩවා දෙන සහනවලට එරෙහිව කම්කරු පන්තිය තුල වැඩෙන විරුද්ධත්වය ද මධ්‍යම නායකත්වයේ ප්‍රතිපත්ති කඩ කිරීම් ද එමෙන් ම නගරයට කෙරෙහි ගම්බද ප්‍රදේශවල විරුද්ධත්වයේ පිලිබිඹුවක් වූ ලෙනින්ග්‍රෑඩයට එරෙහි සතුරුකම් සමහරක් ද ය.

කමනෙව් සහ සිනොවියෙව් සමග එක්ව එක්සත් විරුද්ධ පාර්ශ්වයක් පිහිටුවීමට ට්‍රොට්ස්කි මෙහෙයවුනේ මෙම ආකාරයේ සලකා බැලීම්වලිනි. 1926 අප්‍රේල්වල පැවැත්වුනු මධ්‍යම කාරක සභා පූර්න සැසිවාරවල දී — ක්‍රමයෙන් වැඩි වන ආකාරයකට කෘෂිකාර්මික බදු පැනවීම් ද කර්මාන්ත සඳහා ප්‍රාග්ධන සැපයුම් පුලුල් කිරීම පිලිබඳ පොරොන්දු ද ඇතුලත් කොට ගත් — 1931 වන විට කාර්මික භාන්ඩ හිඟය මග හැරවීමේ පස් අවුරුදු සැලැස්මක් ට්‍රොට්ස්කි යෝජනා කලේ ය. දැන් කර්මාන්තය කෘෂිකර්මය පසුපසින් ගාටන බවටත් එම ඌනතාව ජය ගත යුතු බවටත් එම රැස්වීමේ දී ම කමනෙව් අදහස් ඉදිරිපත් කලේ ය. අදහස්වල මෙම එක්තැන් වීම ඒකාබද්ධ විරුද්ධ පාර්ශ්වය නිර්මානය වීමට මග පෑදී ය.

මීලඟ 18 මාසය තුල දී ට්‍රොට්ස්කි අතිශය තීව්‍ර දේශපාලන අරගලයක යෙදෙන්නට නියමිත විය; ඒ හා සසඳන විට තුන් කට්ටුව සහ ඔහු අතර ඇති වූ ගැටුම් ''හුදෙක් සුලු ආරවුල්'' ලෙස දිස් විය. ඩොයිෂ්චර් සටනේ පරිමානය මෙසේ ග්‍රහනය කර ගනියි: "වෙහෙස නො බලා, අනුකම්පා විරහිත ලෙස සකල ස්නායු පද්ධතියට ම පීඩා ගෙන දෙමින් ද, තර්කයේ සහ ඒත්තු ගැන්වීමේ අසමසම ශක්තීන් පෙල ගස්වා ගනිමින් ද, අසාමාන්‍ය ලෙස පෘථුල අදහස් සහ ප්‍රතිපත්තිමය තලයක ගනුදෙනු කරමින් ද, අන්තිමේ දී මේ වන තෙක් ඔහු හෙලා දැක පිලිකෙව් කල 'තත්ත්වාරක්ෂක සාමාජිකයන්ගෙන්' විශාල කොටසකගේ — පෙනී යන පරිදි බහුතරය විය හැකි ය — සහායත් ලබමින් ද, බොල්ශේවික් පක්ෂය පුබුදු කිරීමටත් විප්ලවයේ ගමන් මග කෙරෙහි තව දුරටත් ආනුභාවය පැතිරවීමටත් ඔහු විස්මයජනක උත්සාහයක් දැරුවේ ය. සටන්කරුවෙකු ලෙස ගත් විට 1926-27 වසරවල දී ඔහු 1917 දී සිටියාට වඩා කුඩාවට නො ව ඊට වඩා දැවැන්තව — වඩා ශ්‍රේෂ්ඨව පවා — පෙනී යා හැකි ය." [23]

***මතු සම්බන්ධයි***

**සටහන්:**


1. Geoffrey Swain, *Trotsky*, (ජෙෆ්රි ස්වේන්, "ට්‍රොට්ස්කි"), Longman, 2006, 159 පි.

2. Leon Trotsky, *1905* (ලියොන් ට්‍රොට්ස්කි, "1905") Penguin, 1973, 8 පි.

3. Leon Trotsky, *Towards Capitalism or Socialism,* in: Leon Trotsky, *The Challenge of the Left Opposition 1923-25* (ලියොන් ට්‍රොට්ස්කි, "1923-25 වාම විරුද්ධ පාර්ශ්වයේ අභියෝගය" නමැති කෘතියෙහි එන ලියොන් ට්‍රොට්ස්කිගේ "ධනවාදය දෙසට ද සමාජවාදය දෙසට ද"), Pathfinder Press, 1980, 343 පි.

4. *Towards Capitalism or Socialism,* 343 පි.

5. *Towards Capitalism or Socialism,* 347 පි.

6. *Towards Capitalism or Socialism,* 358 පි.

7. Richard Day, *Leon Trotsky and the Politics of Economic Isolation* (රිචඩ් ඩේ, "ලියොන් ට්‍රොට්ස්කි සහ ආර්ථික විසංගමනවාදී දේශපාලනය"), Cambridge University Press, 2004, 120-21 පිටු.

8. *Towards Capitalism or Socialism,* 359 පි.

9. *Towards Capitalism or Socialism,* 369 පි.

10. Leon Trotsky, *Culture and Socialism,* in: *Problems of Everyday Life* (ලියොන් ට්‍රොට්ස්කි, " එදිනෙදා ජීවිතයේ ගැටලු" නමැති කෘතියෙහි එන " සංස්කෘතිය සහ සමාජවාදය"), Pathfinder Press, 1973, 228 පි. " සහ [ලියොන් ට්‍රොට්ස්කි, *සංස්කෘතිය හා සමාජවාදය සහ කලාව හා විප්ලවය*, කම්කරු මාවත ප්‍රකාශන, 1979, 2-3 පිටු].

11. Day, 130 පි.

12. Leon Trotsky, *The Third International After Lenin* (ලියොන් ට්‍රොට්ස්කි, "ලෙනින්ගෙන් පසු තුන් වන ජාත්‍යන්තරය"), New Park, 1974, 42-43 පිටු.

13. Leon Trotsky, *The Permanent Revolution* (ලියොන් ට්‍රොට්ස්කි, "නොනවතින විප්ලවය"), New Park, 1975, 11 පි.

14. E.H. Carr, *Socialism in One Country* (ඊ.එච්. කාර්, "තනි රටේ සමාජවාදය"), 2 වන වෙලුම, Penguin, 1970, 182-83 පිටු.

15. Isaac Deutscher, *Trotsky* (අයිසැක් ඩොයිෂ්චර්, "ට්‍රොට්ස්කි"), 2 වන වෙලුම, Oxford University Press, 1970, 248 පි.

16. Swain, 163 පි.

17. Robert Daniels, *The Conscience of the Revolution* (රොබට් ඩැනියෙල්ස්, "විප්ලවයේ හෘදයසාක්ෂිය"), Harvard University Press, 1965, 251

පි.

18. Carr, 43 පි.

19. Day, 103 පි.

20. *The Case of Leon Trotsky* ("ලියොන් ට්‍රොට්ස්කි පිලිබඳ නඩු විභාගය") Merit, New York, 1969, 322-23 පිටු.

21. Trotsky, *Challenge of the Left Opposition 1923-25* (ට්‍රොට්ස්කි, "1923-25 වාම විරුද්ධ පාර්ශ්වයේ අභියෝගය"), 390 පි.

22. Trotsky, *Challenge of the Left Opposition 1923-25,* 391 පි.

23. Deutscher, *Trotsky* (ඩොයිෂ්චර්, "ට්‍රොට්ස්කි"), 2 වන වෙලුම, 271 පි.

© www.wsws.org